## ජනතා වතු සංවර්ධන මණ්ඩලය
## පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

## ඇබෑර්තු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සදහන් තනතුරු සදහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

### 1. <u>සාමාන්‍යාධිකාරී</u>

ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලබන බලතල, කාර්යන් හා වගකීම් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම හා පරිපාලනය යටතේ ඉටුකරමින් ආයතනික කාර්ය මණ්ඩලයට නායකත්වය දෙමින් ද කාර්ය මණ්ඩලය දිරිගන්වමින් ද ආයතනය ඉහළම ඵලදායිතාව කෙරෙහි යොමුකරවීම ද ආයතනයෙහි සමස්ථ කාර්ය සාධනය සම්බන්ධයෙන් මූලික වගකීම හා වගවීම දැරීම ද සාමාන්‍යාධිකාරී තනතුර දරණ අයට පැවරෙන කාර්ය භාරයවේ.

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

(අ) කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණය විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණය විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 05 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

කෘෂිකර්මය/ විද්‍යාවේදී කළමනාකරණ හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 05 ක විශිෂ්ඨ සේවා වාර්තාවක් තිබී නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද.

| | | |
|---|---|---|
| සේවා ශ්‍රේණිය | : | "ජ්‍යෙෂ්ඨ කළමනාකාර " |
| වැටුප් තලය | : | HM 2-1(රු.91,645- 12x2,700/- 124,045) හා ජීවන වියදම් දීමනාව |
| වයස | : | අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. |

දිප ව්‍යාප්ත සේවාවේ 1 වන පන්තියේ නිලධාරීන් අයදුම් කරන්නේ නම්, අන්තර්ග්‍රහනය කිරීමේ පදනම මත බඳවා ගැනීමේ පටිපාටියේදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

## 2. කළමනාකරු (වැවිලි)

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුයායන්/ කර්මාන්තශාලා වලට අදාළව සිදු කරනු ලබන තේ, පොල්, රබර් හා විවිධාංගීකරණ ලද භෝග හා අනෙකුත් ව්‍යාපෘතිවල අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති/සැලසුම් සංවිධානය කිරීම, අදාළ නිර්දේශ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කිරීම, වතුයායන් හා කර්මාන්ත ශාලා දෛනිකව පවත්වා ගෙනයෑම උදෙසාවන අවශ්‍යතාවයන් හඳුනා ගැනීම, මෙහෙයවීම,අධීක්ෂණය, ඇගයීම හා අදාළ වතුයායන් සම්බන්ධීකරණය කිරීම. තේ බ්‍රෝකර්වරුන් සම්බන්ධීකරණය හා එමගින් තේ කර්මාන්ත ශාලාවල තේ සඳහා ඉහළ මිලක් වාර්තා කිරීමට හැකි වන ආකාරයේ ක්‍රමවේදයන් නිර්මාණය කිරීම, අධීක්ෂණය හා පසු විපරම් කිරීම හා රාජ්‍ය ප්‍රතිපත්තීන්, චක්‍රලේඛ හා උපදෙස්, තේ මණ්ඩල මාර්ගෝපදේශ වලට හා අනෙකුත් මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීම.

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කණිෂ්ඨ කළමනාකාර " JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| සේවා ගණය | : | "ජ්‍යෙෂ්ඨ කළමනාකාර " |
| වැටුප් තලය | : | MM 1-1 (රු. 53,175/-10x 1,375/- 15x 1,910/- ) හා ජීවන වියදම් දීමනාව |
| වයස | : | අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. |

## 03. සහකාර අභ්‍යන්තර විගණක - 01

ආයතනික සම්පත්, ආයතනික අභ්‍යන්තර පාලනයන් සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රමවේදයන්ට අදාළ විගණන කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම, වාර්තා කිරීම සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම, ක්‍රියාත්මකභාවය, විමර්ශනය කිරීම ආදී කටයුතුවලට අභ්‍යන්තර විගණකට සහයවීම.

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, වාණිජවේදී, ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සදහන් බාහිර අයදුම්කරුවන් සදහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. " කළමනාකාර සහකාර" - තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයෙහි තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

සේවා ගණය : කණිෂ්ඨ කළමනාකාර

වැටුප් තලය : JM 1-1 - රු. (42,600/– 10 x 755/ -18 x 1,135/– 70,580/-) හා ජීවන වියදම් දීමනාව

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩිවිය යුතුය.

වෙනත් :

සෑම අයදුමකරුවෙකුම

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සදහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සදහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
IV. අනුමත බදවා ගැනීමේ පටිපාටියට අනුව සියළුම අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සදහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිළධාරියෙකු තෝරා ගනු ඇත. අයදුම්කරු පිළිබද තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්ද සහිතව යාවත්කාලීන කරන ලද අයදුම්පත් 2024.11.11වන දින හෝ ඊට ප්‍රථම සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන ලද තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරෙහි සදහන් කල යුතුය.

සභාපති
ජනතා වතු සංවර්ධන මණ්ඩලය
55/75, වොක්ෂෝල් විදිය,
කොළඹ 02.
2024.10.30